**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**

# University of Sri Jayewardenepura

**බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය**

## External Degrees and Extension Courses Unit


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>My Number | USJP/EDU/12/2026 | ලිපිනය<br>Address | තැපැල් පෙට්ටිය 10, ගංගොඩවිල<br>Post Box 10, Gangodawila<br>නුගේගොඩ, ශ්‍රී ලංකා<br>Nugegoda, Sri Lanka , |
| ඔබේ අංකය<br>Your Number | | | |
| දුරකථනය<br>Telephone | 011-2801481, 0113-485404 | වෙබ් අඩවිය<br>Website | www.external.sjp.ac.lk |
| ෆැක්ස්<br>Fax | 011-2802753 | විද්‍යුත් තැපැල<br>E-mail | exams.edecu@sjp.ac.lk |


2026.01.14

ප්‍රිය ශිෂ්‍ය/ශිෂ්‍යාවනි,

**2024 සමාජීය විද්‍යාවේදී පාරිසරික හා සංවර්ධන අධ්‍යයන (සාමාන්‍ය) බාහිර උපාධි I පරීක්ෂණය - 2026 පෙබරවාරි (නව විෂය නිර්දේශය) විභාග අයදුම්පත් කැඳවීම**

ඉහත පරීක්ෂණයට අයදුම් කිරීමට පහත උපදෙස් අනුගමනය කරන ලෙස කරුණාවෙන් දන්වා සිටිමි.

| | |
|---|---|
| **පරීක්ෂණය සඳහා අයදුම් කිරීම** | ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස, Examination → Application Freshers හි ඇති විෂයයන් එකින් එක තෝරා Apply කළ යුතු වේ. (උපාධි I පරීක්ෂණයට අදාළ විෂයයන් 8 මේ ආකාරයෙන් Apply කළ යුතුය) |
| **අයදුම්පත් යොමු කළ යුතු අවසාන දිනය** | 2026 ජනවාරි 26 (රාත්‍රී 12.00 දක්වා) |

**සැලකිය යුතුයි**

I. **මෙම පාඨමාලාවේ 2024 ලියාපදිංචි සිසුන් සඳහා විෂය කේත සංශෝධනය වන අතර සංශෝධිත විෂය නිර්දේශය ඇතුළත් උපාධි පාඨමාලා විවරණිකාව (Prospectus) සහ විස්තරාත්මක විෂය නිර්දේශය (Course Outline) https://external.sjp.ac.lk/course-outlines-arts-degree/ වෙත පිවිස පරිශීලනය කළ හැක.**

II. **ඉහත පරීක්ෂණයට පෙනී සිටීම සඳහා පාඨමාලා ගාස්තු දෙවන වාරිකය සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.** එසේ ගෙවා නොමැති කිසිදු අපේක්ෂකයකුට පරීක්ෂණයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

III. අයදුම්පත් යොමු කිරීමේ (Apply) අවසන් දිනය **2026/01/26 (රාත්‍රී 12.00 දක්වා)** වන අතර එම දිනයෙන් පසුව කිසිදු හේතුවක් මත පරීක්ෂණය සඳහා අයදුම් කළ නොහැක.

IV. පරීක්ෂණයට අදාළ කාල සටහන **www.external.sjp.ac.lk** යන බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ වෙබ් අඩවියෙහි පළ කරන අතර සියළු දැනුවත් කිරීම් වෙබ් අඩවිය/ශිෂ්‍ය තොරතුරු ගොනුව (Student Profile) හරහා පමණක් සිදු වේ.

V. විදේශ ගත සිසුන් සඳහා අයදුම්පත් ඉදිරිපත් කර මාර්ගගත ක්‍රමය ඔස්සේ පෙනී සිටිය හැක. ඒ සඳහා වන විස්තර **http://external.sjp.ac.lk/online-exminations-for-migrated-students/** යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

VI. ඉහත පරීක්ෂණය සඳහා නියමිත දිනට අයදුම් කරන ලද සිසුන්ගේ විභාග ප්‍රවේශපත්‍ර ඔබගේ තොරතුරු ගොනුව (Student Profile) වෙත පිවිස Examination හි ඇති Admission වෙත පිවිස බාගත Download කළ හැක. විභාග ප්‍රවේශපත්‍ර තැපැල් මාර්ගයෙන් නිකුත් නොකරන බව කාරුණිකව සලකන්න.

VII. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයීය 428 වන සනාතන සභාව විසින් අනුමත කරන ලද සංශෝධිත නව විභාග නීති රීති මාලාව **external.sjp.ac.lk/Bachelor of Social Sciences (General) External Degree in Environmental and Development Studies (General) External Degree/ Examinations/ Rules and Regulations** වෙත පිවිස පරිශීලනය කළ හැක.

VIII. **මෙම පරීක්ෂණය සඳහා ඉල්ලුම් කළ අපේක්ෂකයන්ට පමණක් පහත නිර්ණායකයන්ට අනුකූල වන පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කළ හැකිය. පරීක්ෂණයට අයදුම් නොකර වෛද්‍ය වාර්තා ඉදිරිපත් කිරීම වලංගු නොවේ.** නියමිත පරිදි වෛද්‍ය වාර්තා ඉදිරිපත් කර ප්‍රතිඵල නිකුත් කිරීමේදී වෛද්‍ය වාර්තා අනුමත වුවද (ප්‍රතිඵල ලේඛනයේ MC ලැබුණ ද) ඉදිරි පරීක්ෂණය සඳහා විභාග ගාස්තු ගෙවීම අනිවාර්ය වේ.

IX. **උපාධියක් සම්පූර්ණ කිරීම :** උපාධිය ලැබීම සඳහා අවශ්‍යතාවන් පිළිබඳ විස්තර **www.external.sjp.ac.lk** වෙබ් අඩවියේ පල කර ඇති ඔබගේ අධ්‍යයන වර්ෂයට අදාළ ශිෂ්‍ය විවරණිකාව (Prospectus) පරිශීලනය කිරීමෙන් ඔබට ලබා ගත හැකිය.

**<u>ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ</u>**

**<u>428 වැනි සනාතන සභාව විසින් අනුමත කරන ලද විශේෂ කරුණු</u>**

**<u>පරීක්ෂණයට පෙනී නොසිටීම සම්බන්ධයෙන් වෛද්‍ය සහතික ඉදිරිපත් කිරීම</u>**

- නොවැළැක්විය හැකි හේතුවක් මත එසේ කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් එම හේතුව සනාථ කරමින් සාක්ෂි සමග තමා පදිංචි ප්‍රදේශයේ රජයේ ආරෝග්‍ය ශාලාවකින් ලබා ගත් වලංගු වෛද්‍ය සහතිකයක් පෙනී සිටීමට නොහැකි වූ මුළු විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ සහකාර/ ජ්‍යෙෂ්ඨ සහකාර/ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

- පෞද්ගලික වෛද්‍ය ප්‍රතිකාර කරනු ලබන රජයේ පිළිගත් බටහිර, ආයුර්වේද හෝ හෝමියෝපති වෛද්‍යවරුන්ගෙන් ප්‍රතිකාර ලබාගන්නා අපේක්ෂකයෙකු තමා ලබාගත් වෛද්‍ය සහතිකය විශ්වවිද්‍යාලයේ ප්‍රධාන වෛද්‍ය නිලධාරී හමු වී ඔහු ලවා සහතික කරවා ගත යුතු ය. එම සහතිකය පෙනී සිටීමට නොහැකි වූ විභාගය හෝ පෙනී සිටීමට නොහැකි වූ විභාගයේ අදාළ කොටස නිම වී **දින 14ක් ඇතුළත** බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී/ විභාග වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය
2026-01-14